සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA2 විභාගය - 2018 ජනවාරි

## (AA21) උසස් මූල්‍ය ගිණුම්කරණය

(Advanced Financial Accounting)

2018-01-20
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 11
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්යය ප්‍රශ්න හත (07) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

*අංක **1.1** සිට **1.5** දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** **සීමාසහිත අනුරාධා (පෞද්ගලික) සමාගම,** 2016 අප්‍රේල් 01 දින රු.1,000,000/- ක පිරිවැයකට යන්ත්‍රයක් අත්පත් කර ගත්තේය. යන්ත්‍රයේ ඇස්තමේන්තුගත ආයු කාලය වර්ෂ 5 ක් වන අතර, ඇස්තමේන්තුගත සුන්බුන් අගය රු.100,000/- කි:

2017 මාර්තු 31 දිනට යන්ත්‍රයේ ධාරණ අගය වන්නේ:

(1) රු.720,000/-. (2) රු.800,000/-. (3) රු.820,000/-. (4) රු.700,000/-.

(ලකුණු 02)

**1.2** පහත සඳහන් විස්තර **සීමාසහිත පෙරේරා සමාගමේ** 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ වෙළෙඳ ලැබිය යුතු මුදල්වලට අදාල වේ. ව්‍යාපාරයේ සියලුම විකුණුම් ණය පදනම මත සිදු කරයි:

| | රු. |
|---|---|
| 2016 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් | 130,000 |
| ගනුදෙනුකරුවන්ගෙන් ලැබුණු මුදල් | 686,400 |
| දුන් වට්ටම් | 1,400 |
| 2017 මාර්තු 31 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් | 181,000 |

ඉහත සඳහන් තොරතුරු අනුව, 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුළු විකුණුම් වන්නේ:

(1) රු.734,440/-. (2) රු.736,000/-. (3) රු.738,800/-. (4) රු.740,360/-.

(ලකුණු 02)

1.3 **රුවිර** ඔහුගේ සිල්ලර ව්‍යාපාරය සඳහා යෝග්‍ය ගිණුම් වාර්තා පවත්වා නොගනී. ව්‍යාපාරයේ සියලු විකුණුම් මුදල් පදනම මත වේ. 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

| | **රු.** |
|---|---|
| 2016 අප්‍රේල් 01 දිනට තොගය | 670,000 |
| වර්ෂය තුළදී මිලට ගැනුම් | 1,840,000 |
| 2017 මාර්තු 31 දිනට තොගය | 540,000 |

ව්‍යාපාරය විකුණුම් මත 20% ක දළ ලාභයක් තබා ගන්නේ නම්, 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා දළ ලාභය වන්නේ:

(1) රු.1,970,000/-. (2) රු.492,500/-. (3) රු.394,000/-. (4) රු.2,364,000/-.

(ලකුණු 02)

1.4 පහත සඳහන් ප්‍රකාශන අතුරෙන්, ලාභ අරමුණු කර නොගත් සංවිධානයක් [Non-Profit Organization (NPO)] සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ කුමක් ද?

(1) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනවිට, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවීම අවශ්‍ය වේ.

(2) භාණ්ඩ සහ සේවා විකිණීමෙන් උපයන ලාභය ප්‍රධාන ආදායම් ප්‍රභවය නොවේ.

(3) සාමාජික දායක මුදල් උපචිත පදනම මත ගිණුම්ගත කරයි.

(4) ඉහත සඳහන් සියල්ලම වේ. (ලකුණු 02)

1.5 **සීමාසහිත පෙරේරා (පෞද්ගලික) සමාගම,** එකතු කළ අගය මත බදු [Value Added Tax (VAT)] සඳහා ලියාපදිංචි සමාගමකි. 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා පහත සඳහන් තොරතුරු සමාගමේ පොත්වලින් උපුටාගෙන ඇත:

| | **රු.** |
|---|---|
| විකුණුම් [එකතුකළ අගය මත බදු (VAT) රහිතව] | 4,939,940 |
| බදු ඉන්වොයිසි මගින් සනාථ කළ ගැනුම් [එකතු කළ අගය මත බදු (VAT) රහිතව] | 1,777,900 |
| 2017 ජනවාරි 01 දිනට එකතු කළ අගය මත බදු පාලන ගිණුමේ (VAT) බැර ශේෂය | 22,500 |

අදාලවන VAT අනුපාතය 15% කි.

2017 මාර්තු 31 දිනට එකතු කළ අගය මත බදු (VAT) පාලන ගිණුමේ බැර ශේෂය වන්නේ:

(1) රු.496,806/-. (2) රු.474,306/-. (3) රු.289,185/-. (4) රු.451,806/-.

(ලකුණු 02)

*අංක **1.6** සිට **1.7** දක්වා ප්‍රශ්න වලට උත්තර, ප්‍රශ්න අංකය සමග උත්තර පොතේ ලියන්න.*

1.6 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තිය අනුව, පහත සඳහන් එක් එක් ඒවා සඳහා අදාල ප්‍රතිපාදනය **සඳහන් කරන්න**:

**(a)** හවුල්කරුවන් විසින් දුන් ණය සඳහා පොලිය.

**(b)** හවුල් ව්‍යාපාරයේ කළමනාකරණය.

**(c)** ලාභ සහ අලාභ. (ලකුණු 06)

**1.7** සමාගමක් ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් (FIFO) ක්‍රමය භාවිතයෙන් එහි තොග අගය කරයි. 2017 දෙසැම්බර් 01 දිනට, එකක් රු.140/- බැගින් අගය කළ ඒකක 600 ක් සමාගමේ තොගයේ විය. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාසය තුළදී පහත සඳහන් ගනුදෙනු සිදුවිය:

| දිනය | විස්තරය | ඒකක | ඒකකයක මිල (රු.) |
|---|---|---|---|
| 2017 දෙසැම්බර් 20 | මිළදී ගැනුම් | 400 | 220 |
| 2017 දෙසැම්බර් 25 | විකුණුම් | 750 | 310 |
| 2017 දෙසැම්බර් 30 | මිළදී ගැනුම් | 300 | 245 |

2017 දෙසැම්බර් 31 දිනට තොගයේ වටිනාකම **ගණනය කරන්න**. (ලකුණු 04)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්යය ප්‍රශ්න පහ (05) කි.

(මුළු ලකුණු 25)

## 02 වන ප්‍රශ්නය

**සීමාසහිත ටෙක්ස් ගාමන්ට්ස් (පෞද්ගලික) සමාගමේ** 2017 දෙසැම්බර් මාසය සඳහා මුදල් පොතේ බැංකු තීරුව සහ බැංකු ප්‍රකාශනය පහත දැක්වේ:

**සීමාසහිත ටෙක්ස් ගාමන්ට්ස් (පෞද්ගලික) සමාගම**
**2017 දෙසැම්බර් මාසය සඳහා මුදල් පොත (බැංකු තීරුව)**

| දිනය | විස්තරය | | හර (රු.) | බැර (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|---|---|
| 2017.12.01 | ගිණුම විවෘත කිරීමට මූලික තැන්පතුව | | 1,000,000 | - | 1,000,000 |
| 2017.12.02 | මුදල් තැන්පතු | | 480,760 | | 1,480,760 |
| 2017.12.09 | ණයහිමියන්ට ගෙවීම් | 637101 | | 132,580 | 1,348,180 |
| 2017.12.15 | කුලී ගෙවීම් | 637102 | | 125,540 | 1,222,640 |
| 2017.12.15 | මුදල් තැන්පතු | | 12,580 | | 1,235,220 |
| 2017.12.18 | ණයගැතියෙකුගේ තැන්පතු | | 766,600 | | 2,001,820 |
| 2017.12.18 | චෙක්පත් තැන්පතු | | 154,540 | | 2,156,360 |
| 2017.12.21 | විදුලිය ගෙවීම් | 637103 | | 12,000 | 2,144,360 |
| 2017.12.21 | ණයහිමියන්ට ගෙවීම් | 637104 | | 52,480 | 2,091,880 |
| 2017.12.25 | ඍජු මාරු කිරීම - වැටුප් | | | 1,955,640 | 136,240 |
| 2017.12.31 | ශේෂය | | - | - | 136,240 |

**සීමාසහිත ටෙක්ස් ගාමන්ට්ස් (පෞද්ගලික) සමාගම**
**2017 දෙසැම්බර් මාසය සඳහා බැංකු ප්‍රකාශනය**

| දිනය | විස්තරය | යොමුව | හර (රු.) | බැර (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|---|---|
| 2017.12.01 | ඉ/ගෙ ශේෂය | | - | - | - |
| 2017.12.01 | මුදල් තැන්පතු - ගිණුම විවෘත කිරීම | | | 1,000,000 | 1,000,000 |
| 2017.12.01 | චෙක්පොත් ගාස්තු | | 500 | | 999,500 |
| 2017.12.02 | මුදල් තැන්පතු | | | 480,760 | 1,480,260 |
| 2017.12.15 | මුදල් තැන්පතු | | | 12,580 | 1,492,840 |
| 2017.12.18 | ඍජු තැන්පතු | යොමුව 12542165 | | 766,600 | 2,259,440 |
| 2017.12.18 | චෙක්පත් තැන්පතු | | | 154,540 | 2,413,980 |
| 2017.12.22 | චෙක්පතින් ගෙවීම | 637103 | 12,000 | | 2,401,980 |
| 2017.12.22 | බැංකු ගාස්තු | | 13,670 | | 2,388,310 |
| 2017.12.25 | මාරු කිරීම් | යොමුව 23154851 | 1,955,640 | | 432,670 |
| 2017.12.30 | ස්ථාවර නියෝග | ණය අංකය 62587413 | 69,000 | | 363,670 |
| 2017.12.30 | චෙක්පතින් ගෙවීම | 637101 | 132,580 | | 231,090 |
| 2017.12.31 | ශේෂය | | | | 231,090 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත දෑ **පිළියෙල කරන්න**:

(a) 2017 දෙසැම්බර් 31 දිනට ගළපන ලද මුදල් පොත. (ලකුණු 03)

(b) 2017 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සීමාසහිත පේ වෙල් (පෞද්ගලික) සමාගමේ** 2017 දෙසැම්බර් මාසය සඳහා වැටුප් විස්තර පහත දැක්වේ:

| මූලික වැටුප (රු.) | දීමනා (රු.) | දළ වැටුප (රු.) | ණය වාරික (රු.) | සේවක අර්ථසාධක අරමුදලට අඩුකිරීම (රු.) | ශුද්ධ වැටුප (රු.) |
|---|---|---|---|---|---|
| 8,700,000 | 5,400,000 | 14,100,000 | (2,300,000) | (696,000) | 11,104,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) සේවක අර්ථසාධක අරමුදලට [Employees' Provident Fund (EPF)] සහ සේවක භාරකාර අරමුදලට [Employees' Trust Fund (ETF)] දායකය මූලික වැටුප මත ගණනය කරයි.

(2) සේවක අර්ථසාධක අරමුදලට සේවකයින්ගේ සහ සමාගමේ දායකත්වය පිළිවෙලින් 8% ක් සහ 12% ක් වේ.

(3) සේවක භාරකාර අරමුදලට සමාගමේ දායකත්වය 3% කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත සඳහන් ගනුදෙනු වාර්තා කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්, මුදල් ගනුදෙනුවලට අදාල සටහන් ද ඇතුළුව **පිළියෙල කරන්න**. (ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

කේවල ස්වාමි ව්‍යාපාරයක් වන **අමල් ට්‍රේඩර්ස් හි** ගිණුම් පොත්වලින් 2017 දෙසැම්බර් මාසය සඳහා පහත සඳහන් විස්තර උපුටා ගන්නා ලදී:

| | රු. |
|---|---|
| 2017 දෙසැම්බර් 01 දිනට ණයහිමි පාලන ගිණුම | 2,350,000 |
| 2017 දෙසැම්බර් 01 දිනට ණයගැති පාලන ගිණුම | 1,780,000 |
| <u>මාසය තුළදී සිදුවූ ගනුදෙනු</u>: | |
| ණයට ගැනුම් | 6,100,000 |
| ණයට විකුණුම් | 4,800,000 |
| ණයහිමියන්ගෙන් ලද වට්ටම් | 250,000 |
| ණයහිමියන්ට කළ ගෙවීම් | 4,050,000 |
| ණයගැතියන්ගෙන් ලැබුණ වටිනාකම | 3,950,000 |
| ලියාහරින ලද බොල් ණය | 70,000 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 දෙසැම්බර් මාසය සඳහා පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ණයගැති පාලන ගිණුම. (ලකුණු 03)

(b) ණයහිමි පාලන ගිණුම. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 05 වන ප්‍රශ්නය

**රත්මල් හවුල් ව්‍යාපාරයේ** හවුල්කරුවන් වූ **A, B** සහ **C** පිළිවෙලින් 4 : 3 : 3 අනුපාතයට ලාභා'ලාභ බෙදාගෙන තිබුණි. 2017 අප්‍රේල් 01 දින, **B** හවුල්ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කළ අතර, **A** සහ **C** ලාභා'ලාභ සම සමව බෙදාගනිමින් හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යාමට එකඟ වූහ.

2017 අප්‍රේල් 01 දිනට, හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු.930,000/- කට අගය කළ අතර, කීර්තිනාම ගිණුමක් පොත්වල පවත්වා නොගැනීමට තීරණය කරන ලදී.

2017 අප්‍රේල් 01 දින මෝටර් වාහන ප්‍රත්‍යාගණනය කළ අතර, හවුල් ව්‍යාපාරයේ මෝටර් වාහනවල විස්තර පහත දැක්වේ:

| | **පිරිවැය** | **2017 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය** | **2017 අප්‍රේල් 01 දිනට ප්‍රත්‍යාගණන අගය** |
|---|---|---|---|
| මෝටර් වාහන | 1,800,000 | 900,000 | 1,200,000 |

මෝටර් වාහන ගිණුම් පොත්වල ප්‍රත්‍යාගණිත අගයට දක්වනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත කීර්තිනාමය සහ ප්‍රත්‍යාගණනය වාර්තා කිරීම සඳහා ජර්නල් සටහන් **පිළියෙල කරන්න**. (ලකුණු 05)

## 06 වන ප්‍රශ්නය

**ශ්‍රී හරාත් එන්ටර්ප්‍රයිස් හි** මෝටර් වාහන පිළිබඳ විස්තර පහත දැක්වේ:

(1) 2014 ජූලි 01 දින රු.3,200,000/- ක පිරිවැයකට මිලට ගත් බෙදාහැරීමේ වෑන් රථය 2016 ජූලි 01 දින රු.2,000,000/- කට විකුණන ලදී.

(2) 2016 ඔක්තෝම්බර් 01 දින රු.4,500,000/- ක පිරිවැයකට නව බෙදාහැරීමේ ට්‍රක් රථයක් මිලට ගන්නා ලදී.

(3) ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ, මෝටර් වාහන, පිරිවැය මත 25% බැගින්, සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීමයි.

(4) ව්‍යාපාරයේ වෙනත් මෝටර් වාහන නොමැති බව උපකල්පනය කරන්න.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) මෝටර් වාහන විකිණීම මත ලාභය (අලාභය). (ලකුණු 03)

(b) මෝටර් වාහන මත වර්ෂය සඳහා ක්ෂය. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

*B කොටසෙහි අවසානය*

## <u>C කොටස</u>

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

### 07 වන ප්‍රශ්නය

**හැපි ක්‍රීඩා සමාජය** එහි සාමාජිකයන්ට ක්‍රීඩා පහසුකම් සපයන අතරම අවන්හලක් පවත්වාගෙන යාම සහ බාහිර අවස්ථා සඳහා එහි ක්‍රීඩා උපකරණ කුලියට දීම සිදුකරයි.

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **හැපි ක්‍රීඩා සමාජයේ** ලැබීම් සහ ගෙවීම් ගිණුම පහත දැක්වේ:

**ලැබීම් සහ ගෙවීම් ගිණුම** *(රු.'000)*

| | | | |
|---|---|---|---|
| 2017 ජනවාරි 01 දින ඉ/ගෙ ශේෂය | 6,000 | අවන්හලේ සැපයුම්කරුවන්ට කළ ගෙවීම් | 7,200 |
| පරිත්‍යාග | 7,500 | අවන්හලේ වෙනත් වියදම් | 1,200 |
| ක්‍රීඩා උපකරණ මත කුලී ආදායම | 8,200 | ලේඛන කටයුතු (secretarial) වියදම් | 600 |
| සාමාජික දායක මුදල් | 26,300 | ලිපිද්‍රව්‍ය, මුද්‍රණ සහ ප්‍රචාරණ වියදම් | 1,500 |
| අවන්හලේ විකුණුම් | 14,700 | ක්‍රීඩා උපකරණ<br>(2017 දෙසැම්බර් 31 දින මිලදී ගන්නා ලදී) | 18,000 |
| | | විවිධ වියදම් | 5,100 |
| | | 2017 දෙසැම්බර් 31 දින ප/ගෙ ශේෂය | 29,100 |
| | **62,700** | | **62,700** |

වත්කම් සහ වගකීම් පහත පරිදි විය: *(රු.'000)*

| | 2017 ජනවාරි 01 දිනට | 2017 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|
| අවන්හලේ වෙළෙඳ ගෙවිය යුතු මුදල් (සැපයුම්කරුවන්) | 1,200 | 1,400 |
| ඊළඟ වර්ෂය සඳහා කලින් ලැබුණු සාමාජික දායක මුදල් | 400 | 200 |
| හිඟ සාමාජික මුදල් | 600 | 300 |
| ක්‍රීඩා උපකරණ | 54,000 | 57,000 |
| අවන්හලේ තොග (පිරිවැයට) | 3,200 | 2,600 |
| උපචිත වියදම් (ලිපිද්‍රව්‍ය, මුද්‍රණ සහ ප්‍රචාරණය) | 500 | 800 |

පරිත්‍යාග, කාලපරිච්ඡේදය සඳහා ආදායමක් වශයෙන් හඳුනාගත යුතුය. 2017 දෙසැම්බර් 31 දින මිලට ගත් ක්‍රීඩා උපකරණ හැර වර්ෂය තුළදී දේපළ, පිරියත සහ උපකරණ එකතුකිරීම් හෝ ඉවත්කිරීම් නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙළ කරන්න**:

(a) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අවන්හලේ වෙළෙඳ ගිණුම. (ලකුණු 03)

(b) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **හැපි ක්‍රීඩා සමාජයේ** ආදායම් සහ වියදම් ගිණුම. (ලකුණු 07)

(මුළු ලකුණු 10)

## 08 වන ප්‍රශ්නය

කේවල ස්වාමි ව්‍යාපාරයක් වන **ගැමි කලෙක්ෂන්ස්** හි 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

(1) ව්‍යාපාරයේ වත්කම් සහ වගකීම් පහත පරිදි වේ:

| | **2016 අප්‍රේල් 01 දිනට (රු.)** | **2017 මාර්තු 31 දිනට (රු.)** |
|---|---|---|
| කාර්යාල උපකරණ (ධාරණ අගයට) | 550,000 | 495,000 |
| තොගය | 192,000 | 180,000 |
| අතැති මුදල් | 230,000 | ? |
| බැංකුවේ ඇති මුදල් | 300,000 | ? |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 160,000 | 282,000 |
| උපචිත විදුලිය | - | 3,000 |

(2) සියලු විකුණුම් මුදල් පදනමින් සිදුකරන අතර, පිරිවැය මත 50% ක දළ ලාභයක් තබා ගැනේ.

(3) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී, මුදලට කළ විකුණුම්වලින් රු.456,000/- ක මුදලක් බැංකු ගිණුමේ තැන්පත් කර තිබේ.

(4) වර්ෂය තුළදී චෙක්පත්වලින් පහත සඳහන් ගෙවීම් සිදුකර ඇත:

| | **රු.** |
|---|---|
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 190,000 |
| විදුලිය | 13,000 |
| වෙනත් වියදම් | 55,000 |

(5) ඉහත ඒවාට අමතරව, පහත සඳහන් ගෙවීම් මුදලින් කර ඇත:

| | **රු.** |
|---|---|
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 168,000 |
| වේතන | 90,000 |
| ගැනිලි | 10,000 |

(6) සියලු ගැනුම් ණය පදනමින් සිදුකර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 මාර්තු 31 දිනට, **ගැමි කලෙක්ෂන්ස් හි** ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## **09** වන ප්‍රශ්නය

**MA හවුල් ව්‍යාපාරයේ** හවුල්කරුවන් වන **මනු** සහ **අනු**, ලාභා'ලාභ පිළිවෙලින් 3 : 1 අනුපාතයට ඔවුන් අතර බෙදා ගනිති. 2016 අප්‍රේල් 01 දින, පහත කොන්දේසි යටතේ හවුල්කරුවෙකු වශයෙන් **දනු** ඇතුලත් කර ගැනීමටත් **MAD පාර්ට්නර්ස්** නමින් හවුල්ව්‍යාපාරය පවත්වාගෙන යාමටත් ඔවුහු එකඟ වූහ:

(1) **මනු, අනු** සහ **දනු** අතර පිළිවෙලින්, 5 : 3 : 2 අනුපාතයට ලාභා'ලාභ බෙදාගත යුතු වේ.

(2) ආරම්භක ප්‍රාග්ධන ශේෂයන් මත වාර්ෂිකව 12% ක පොලියක් ප්‍රාග්ධනය මත ගෙවිය යුතුය.

(3) **මනු,** රු.30,000/- ක මාසික වැටුපකට හිමිකම් ලබයි.

2017 මාර්තු 31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමෙන් පහත සඳහන් ශේෂයන් උපුටා ගන්නා ලදි:

| | **හර (රු.)** | **බැර (රු.)** |
|---|---|---|
| 2016 අප්‍රේල් 01 දිනට, ප්‍රාග්ධන ගිණුම්: | | |
| **මනු** | | 8,000,000 |
| **අනු** | | 4,000,000 |
| **දනු** | | 6,000,000 |
| 2016 අප්‍රේල් 01 දිනට, ජංගම ගිණුම්: | | |
| **මනු** | | 1,000,000 |
| **අනු** | 400,000 | |
| වර්ෂය තුළදී ගැනිලි: | | |
| **මනු** | 300,000 | |
| **අනු** | 200,000 | |
| **දනු** | 100,000 | |

2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ විසර්ජනය කිරීමට පෙර ශුද්ධ ලාභය රු.3,000,000/-කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **MAD පාට්නර්ස්** හවුල් ව්‍යාපාරයේ පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ලාභා'ලාභ විසර්ජන ගිණුම. (ලකුණු 04)

(b) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

*C කොටසෙහි අවසානය*

# <u>D කොටස</u>

අනිවාර්යය ප්‍රශ්නයකි.

(ලකුණු 25)

## 10 වන ප්‍රශ්නය

**සීමාසහිත ලකී 13 (පෞද්ගලික) සමාගමේ** 2017 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ:

*(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 300,000) | | 32,000 |
| 2016 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 12,000 |
| 12% ණයකර | | 20,000 |
| ඉඩම සහ ගොඩනැගිලි පිරිවැයට (ඉඩම - රු. මිලියන 30) | 80,000 | |
| කාර්යාල උපකරණ, පිරිවැයට | 40,000 | |
| 2016 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිලි | | 5,000 |
| කාර්යාල උපකරණ | | 25,000 |
| 2017 මාර්තු 31 දිනට තොගය, පිරිවැයට | 60,000 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 43,000 | |
| 2016 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා දීමනාව | | 1,600 |
| බැංකුවේ ඇති මුදල් | 1,000 | |
| ගෙවූ ආදායම් බදු | 3,200 | |
| විකුණුම් | | 463,600 |
| විකුණුම් පිරිවැය | 265,500 | |
| බෙදාහැරීමේ වියදම් | 51,700 | |
| පරිපාලන වියදම් | 68,000 | |
| ගෙවූ ණයකර පොලිය | 1,200 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 50,900 |
| 2016 අප්‍රේල් 01 දිනට ආදායම් බදු ප්‍රතිපාදනය (2015/16 තක්සේරු වර්ෂය සඳහා) | | 3,500 |
| | **613,600** | **613,600** |

පහත සඳහන් අතිරේක තොරතුරුද සපයා ඇත:

(1) 2017 මාර්තු 31 දිනට තොගයේ ශුද්ධ උපලබ්ධි අගය [net realizable value (NRV)] රු.59,200,000/- ලෙස ඇස්තමේන්තු ගතකර ඇත.

(2) 2017 මාර්තු 31 දිනට සමාගමට රු.1,500,000/- ක් ගෙවිය යුතුව තිබූ ගනුදෙනුකරුවෙක්, 2017 මැයි 20 දින බුන්වත් වූ බැව් ප්‍රකාශ කර ඇති බැවින් අයවිය යුතු සම්පූර්ණ මුදලම අයකරගත නොහැකි තත්ත්වයට පත්විය. ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් වලින් 5% ක දීමනාවක් පවත්වාගෙන යාමටද තවදුරටත් තීරණය කරන ලදි.

(3) දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැය මත, සරල මාර්ග ක්‍රමය අනුව ක්ෂය කළ යුතුව ඇත. වත්කම්වල ප්‍රයෝජනවත් ආයුකාලය පහත පරිදි විය:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | : | වර්ෂ 25 |
| කාර්යාල උපකරණ | : | වර්ෂ 10 |

වර්ෂය තුළදී දේපළ, පිරියත සහ උපකරණ එකතුකිරීම් හෝ ඉවත් කිරීම් නොමැත.

(4) පොලිය අර්ධ වාර්ෂිකව ගෙවිය යුතු වන, එකක් රු.100/- ක් වන 12% ණයකර 200,000 ක් සමාගම විසින් 2016 අප්‍රේල් 01 දින නිකුත් කරන ලදි. වර්ෂය තුළදී ගෙවන ලද පොලිය, ගෙවූ ණයකර පොලී ගිණුමට අයකර ඇත.

(5) 2017 මාර්තු 31 දිනට පහත සඳහන් උපචිත වියදම් සහ කලින් ගෙවූ වියදම් ගිණුම් ගත කළ යුතු වේ:

| | රු. |
|---|---|
| උපචිත ප්‍රචාරණ වියදම් | 800,000 |
| කලින් ගෙවූ රක්ෂණය | 120,000 |

(6) 2015/16 වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම රු.3,200,000/- ක් වූ අතර, 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී එය සම්පූර්ණයෙන් පියවන ලදි. ගෙවන ලද මුදල, ගෙවූ ආදායම් බදු ගිණුමට අයකර ඇත. 2016/17 වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම රු.3,800,000/- ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

(7) සමාගමේ අධ්‍යක්ෂකවරු 2017 ජූනි 30 දින මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමත කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත ලකී 13 (පෞද්ගලික) සමාගමේ,** කළමනාකරණයේ භාවිතය සඳහා පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 10)

(b) 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 15)

(මුළු ලකුණු 25)

*D කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |